සවියෙන් පෙරට - අපි එකට

e-ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | ඉතිහාසය | 3 | 05. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික නිදහස් ව්‍යාපාරය |





සැකසුම: දිනූෂා සමරවීර

බප/හො/පලන්නොරුව ම.ම.වි

# කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ 1833

- හඳුන්වා දීමට හේතුව → රජයේ ආදායමට වඩා වියදම වැඩිවීම

- විමර්ශනයට ලක්වූ අංශ

රජයේ ආදායම් හා වියදම් - W.M.G.කෝල්බෲක්

අධිකරණ ක්ෂේත්‍රය - චාල්ස් හේ කැමරන්

# කැපී පෙනෙන ලක්ෂණ

- ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම
- උඩරට හා පහතරට ඒකාබද්ධ වූ පාලන ක්‍රමයක් හඳුන්වාදීම
- පරිපාලන කටයුතු සඳහා මුළු රට පළාත් පහකට බෙදීම
- අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
- ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් කිරීම

# ව්‍යවස්ථාදායක සභාව




ප්‍රධාන කාර්යය නීති සම්පාදනයයි

# විධායක සභාව

- විධායක සභාවේ මූලාසනය - **ආණ්ඩුකාරවරයා**
- විධායක සභාවට ඇතුළත් පිරිස
  - යටත් විජිත ලේකම්
  - භාණ්ඩාගාරික
  - ගණකාධිකාරී
  - කොළඹ රේගු අයකැමි
  - මිනුම්පති

**ප්‍රධාන කාර්යය මුදල් කටයුතු පිළිබඳ ආණ්ඩුකාරවරයාට තිබූ බලතල සීමා කිරීමයි**

## ආණ්ඩුකාරවරයාගේ බලතල අඩුකිරීමට ගත් ක්‍රියාමාර්ග

- ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම

## රජයේ වියදම අඩුකිරීමට ගත් ක්‍රියාමාර්ග

- උඩරට හා පහතරට ඒකාබද්ධ වූ පාලන ක්‍රමයක් හඳුන්වාදීම
- පරිපාලන කටයුතු සඳහා මුළු රට පළාත් පහකට බෙදීම
- අනිවාර්ය රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
- ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් කිරීම

# ශ්‍රී ලාංකිකයන්ගේ උද්ඝෝෂණ

- 1865 දී ලංකා සංගමය පිහිටුවීම (ජෝර්ජ් වෝල්)
- උද්ඝෝෂණවලට නායකත්වය දුන් උගත් ලාංකිකයන්

**පොන්නම්බලම් රාමනාදන්**

**පොන්නම්බලම් අරුණාචලම්**

**සර් ජේම්ස් පීරිස්**

- උද්ඝෝෂණ මෙහෙයවීමට මුල්වූ සංවිධාන

**හලාවත සංගමය**

**යාපනය සංගමය**

**පහතරට නිෂ්පාදන සංගමය**

- මුල්වරට යටත් විජිත භාර ලේකම්වරයාට විධිමත් සන්දේශයක් ඉදිරිපත් කළේ **සර් ජේම්ස් පීරිස්** විසිනි

- පෙත්සම් මගින් ලාංකිකයන් ඉදිරිපත් කළ ප්‍රතිසංස්කරණ යෝජනා

ව්‍යවස්ථාදායක සභාවට ඡන්ද බලයෙන් නියෝජිතයන් පත් කිරීම

ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් පිරිස වැඩි කිරීම

වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම

# ක්‍රෑව් මැකලම් ප්‍රතිසංස්කරණය 1910

- හඳුන්වාදුන් ආණ්ඩුකාරවරයා හා යටත් විජිත ලේකම්

  ආණ්ඩුකාරවරයා → හෙන්රි මැකලම්

  යටත් විජිත ලේකම් → ක්‍රෑව් සාමිවරයා

- විශේෂ ලක්ෂණය

  සීමිත ඡන්ද බලය හඳුන්වාදීම

- වැදගත්කම

  සීමිත ඡන්ද බලය හඳුන්වාදීම නිසා උගත් ලාංකිකයන් වෙනුවෙන් පොන්නම්බලම් රාමනාදන් මහතා පත්වීම

# ව්‍යවස්ථාදායක සභාව (21)



# ලංකා ජාතික සංගමය

| පිහිටවූ වර්ෂය | 1919 |
| --- | --- |
| ප්‍රථම සභාපති | පොන්නම්බලම් අරුණාචලම් |
| සංගමයට එක්වූ කුඩා සංවිධාන | •හලාවත සංගමය<br>•යාපනය සංගමය<br>•ලංකා ජාතික සංවිධානය<br>•ලංකා ප්‍රතිසංස්කරණ සංගමය |
| ප්‍රධාන අරමුණ | •ලාංකිකයන් අතට දේශපාලන බලතල ලබාගැනීම සඳහා ශක්තිමත් උද්ඝෝෂණ ව්‍යාපාරයක් දියත් කිරීම |
| අනෙකුත් අරමුණු | •ව්‍යවස්ථාදායක සභාවේ ලාංකික සාමාජිකයන් වැඩි කරගැනීම<br>•එහි බලතල වැඩිකරගැනීම<br>•ඡන්ද බලයෙන් නියෝජිතයන් බහුතරයක් තෝරාගැනීමට අවස්ථාව ලැබීම<br>•දේශීය නායකයන්ට පාලන කටයුතුවලට සම්බන්ධ වීමට වැඩි වැඩියෙන් අවස්ථාව ලබාගැනීම |
| අරමුණු දිනාගැනීමට ගත් ක්‍රියාමාර්ග | •බ්‍රිතාන්‍ය රජයට පෙත්සම් යැවීම<br>•යටත් විජිත ලේකම්වරයාට පෙත්සම් යැවීම<br>•රැස්වීම් පවත්වා ජනතාව දැනුවත් කිරීම<br>•ව්‍යවස්ථාදායකය තුළ තර්ක ඉදිරිපත් කිරීම<br>•පුවත්පත්වලට ලිපි ලිවීම |

# මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය 1920

සම්බන්ධ වූ ආණ්ඩුකාරවරයා

**විලියම් මැනිං**

වැදගත් ලක්ෂණය

- **පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වාදීම**

# ව්‍යවස්ථාදායක සභාව (37)



# 1924 මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

## සම්බන්ධ වූ පුද්ගලයන්

ආණ්ඩුකාරවරයා ⟹ විලියම් මැනිං

යටත් විජිත ලේකම් ⟹ ඩෙවොන්ෂයර්

## විශේෂ ලක්ෂණය

- ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් පිරිස සැබෑ ලෙසම බහුතරයක් වීම

නිල ලත් 12 + නම් කිරීමෙන් පත්කළ 08 = 20

ඡන්දයෙන් පත්වූ ගණන = 29

# ව්‍යවස්ථාදායක සභාව (49)



# 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

**සම්බන්ධ වූ පුද්ගලයා**

ඩොනමෝර් සාමි

**ආණ්ඩුක්‍රමයේ විශේෂ ලක්ෂණ**

- ආසියාවේ ප්‍රථම වරට **සර්වජන ඡන්ද බලය** ලැබීම
- වාර්ගික නියෝජනය අවසන් වීම
- විධායක කාරක සභා ක්‍රමය තුළින් ලාංකිකයන්ට කැබිනට් ආණ්ඩු ක්‍රම පිළිබඳ පුහුණුවක් ලැබීම

# රාජ්‍ය මන්ත්‍රණ සභාව



# ප්‍රතිසංස්කරණ යෝජනා

| යෝජනාව | විශේෂ ලක්ෂණ |
|---|---|
| රාජ්‍ය මන්ත්‍රණ සභාව | •ව්‍යවස්ථාදායක සභාව හඳුන්වන ලද්දේ රාජ්‍ය මන්ත්‍රණ සභාව යනුවෙනි<br>•සාමාජිකයන් ගණන 61 කි<br>•රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මූලාසනය කථානායකවරයාට හිමි විය යුතුය<br>මෙරට ප්‍රථම කථානායකවරයා ෆ්‍රැන්සිස් මොලමුරේය<br>•රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නිල කාලය වසර 5 කි |
| සර්වජන ඡන්ද බලය | වයස අවුරුදු 21ට වැඩි ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම ඡන්ද බලය හිමිවීම |
| විධායක කාරක සභා පිහිටුවීම | විධායක කටයුතු සඳහා රාජ්‍ය මන්ත්‍රණ සභාව කාරක සභා 7කට බෙදා ඇත<br>•ස්වදේශ කටයුතු<br>•කෘෂිකර්මය හා ඉඩම්<br>•පළාත් පාලනය<br>•සෞඛ්‍යය<br>•අධ්‍යාපනය<br>•කම්කරු කර්මාන්තය හා වෙළෙඳාම<br>•ගමනාගමනය හා පොදු වැඩ |

| යෝජනාව | විශේෂ ලක්ෂණ |
|---|---|
| ආණ්ඩුකාරවරයා | **බලතල**<br>•පනත්වලට අවසාන අනුමැතිය ලබාදීම<br>•රාජ්‍ය සේවයේ නිලධාරීන් පත් කිරීම |
| රාජ්‍ය නිලධාරීන් තිදෙනා | •රාජ්‍ය ආරක්ෂක කටයුතු, මුදල් කටයුතු හා නීති කටයුතු රාජ්‍ය නිලධාරීන් තිදෙනාට පැවරීම |



# 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

සම්බන්ධ වූ පුද්ගලයා

සෝල්බරි සාමි



# ප්‍රධාන ලක්ෂණ

- ආණ්ඩුකාර ධුරය අහෝසි කර අග්‍රාණ්ඩුකාර ධූරයක් ඇති කිරීම
- ද්වි මණ්ඩල පාර්ලිමේන්තුවක් පිහිටුවීම
- අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයක් ඇති කිරීම
- රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම පිහිටුවීම

# ආණ්ඩුකාර ධුරය අහෝසි කර අග්‍රාණ්ඩුකාරධූරයක් ඇති කිරීම

මෙරට පළමු අග්‍රාණ්ඩුකාරවරයා



සර් හෙන්රි මන්ක් මේසන් මුවර්

# ද්වී මණ්ඩල පාර්ලිමේන්තුවක් පිහිටුවීම

- **පාර්ලිමේන්තුව** යන ආයතනය හදුන්වා දුන්නේ සෝල්බරි ආණ්ඩු ක්‍රමයෙනි
- පාර්ලිමේන්තුවේ කාර්යභාරය වනුයේ **නීති සම්පාදනයයි**
- එහි නිල කාලය වසර 5 කි
- එය ද්වී මණ්ඩල පාර්ලිමේන්තුවකි



# අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයක් ඇති කිරීම

- නීති ක්‍රියාත්මක කිරීමේ බලය අගමැති හා කැබිනට් මණ්ඩලයට හිමිය
- කැබිනට් මණ්ඩලයේ නායකයා අගමැතිය
- මහජන මන්ත්‍රී මණ්ඩලයේ වැඩි කැමැත්ත ලබාගත් තැනැත්තා **අගමැති** බවට පත්වේ
- කැබිනට් මණ්ඩලය ආණ්ඩුව ගන්නා තීරණවලට සාමූහිකව වග කියයි

# රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම පිහිටුවීම

## රාජ්‍ය සේවා කොමිසම

- සාමාජිකයන් 3 කි
- පහල රාජ්‍ය සේවකයන් පත් කිරීම, ඉවත් කිරීම හා විනයානුකූල පාලනය

## අධිකරණ සේවා කොමිසම

- පහල අධිකරණවල විනිසුරුවරුන් පත් කිරීම, ඉවත් කිරීම හා විනයානුකූල පාලනය

# සාරාංශය

| ආණ්ඩු ක්‍රමය | හඳුන්වා දුන් වර්ෂය | ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් ගණන | වාසි | අවාසි |
|---|---|---|---|---|
| කෝල්බෲක් | 1833 | 15 | •පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය කරායන ගමනට පදනම වැටීම<br>•ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් විම<br>•ලංකාව තුළ ඒකීය පාලනයක් ඇතිවීම | •ජනවාර්ගික නියෝජනයක් ඇතිවීම<br>•රාජකාරී ක්‍රමය අහෝසි වීම නිසා කෘෂිකර්මය පිරිහීම<br>•ව්‍යවස්ථාදායකය තුළ නිලලත් පිරිස බහුතරයක් වීම |
| කෲව්-මැකලම් | 1910 | 21 | •සීමිත ඡන්ද බලය හඳුන්වාදීම | •වාර්ගික නියෝජන ක්‍රමය අනුව නියෝජිතයන් පත් කිරීම<br>•ආණ්ඩුකරු සතු බලතල වැඩිවීම |

| ආණ්ඩු ක්‍රමය | හඳුන්වා දුන් වර්ෂය | ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් ගණන | වාසි | අවාසි |
|---|---|---|---|---|
| මැනිං | 1920 | 37 | •පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වාදීම | •ජනවාර්ගික නියෝජනයක් ඇතිවීම<br>•නිල නොලත් සාමාජිකයන් පිරිස සැබෑ ලෙස බහුතරයක් නොවීම |
| මැනිං-ඩෙවොන්ෂයර් | 1920 | 49 | •නිල නොලත් සාමාජිකයන් පිරිස සැබෑ ලෙස බහුතරයක් වීම | •වාර්ගික නියෝජන ක්‍රමය අනුව නියෝජිතයන් පත් කිරීම<br>•බලය හා වගකීම වෙන්ව පැවතීම නිසා රට පාලනය කිරීම අපහසු වීම |

| ආණ්ඩු ක්‍රමය | හඳුන්වා දුන් වර්ෂය | ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් ගණන | වාසි | අවාසි |
| --- | --- | --- | --- | --- |
| ඩොනමෝර් | 1931 | 61 | •සර්වජන ඡන්ද බලය හඳුන්වාදීම<br>•වාර්ගික නියෝජනය අවසන් වීම<br>•විධායක කාරක සභා ක්‍රමය තුළින් ලාංකිකයන්ට කැබිනට් ආණ්ඩු ක්‍රමය පිළිබඳ පුහුණුවක් ලැබීම | •රාජ්‍ය නිලධාරීන් තිදෙනා බලවත් වීම |
| සෝල්බරි | 1947 | 101 | •පාර්ලිමේන්තු ක්‍රමය හඳුන්වාදීම | •අග්‍රාණ්ඩුකාරවරයාට අගමැතිගේ උපදෙස් මත කටයුතු කිරීමට සිදුවීම |

සවියෙන් පෙරට - අපි එකට

**e - ඉගෙනුම් පාසල**

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | ඉතිහාසය | 3 | 05. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික නිදහස් ව්‍යාපාරය - ඇගයීම |

**සැකසුම: දිනූෂා සමරවීර**
**බප /හො/පලන්නොරුව ම. ම. වි.**

1. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය හඳුන්වාදීමට හේතුව කුමක්ද?
2. කෝල්බෲක් කොමිසමෙහි විමර්ශනයට ලක්වූ අංශ මොනවාද?
3. එහි කැපී පෙනෙන ලක්ෂණ නම් කරන්න.
4. ව්‍යවස්ථාදායක සභා හා විධායක සභා පිහිටුවීමේ අරමුණ කුමක්ද?
5. එම ප්‍රතිසංස්කරණය යටතේ රජයේ වියදම අඩුකිරීමට ගත් ක්‍රියාමාර්ග මොනවාද?
6. ශ්‍රී ලාංකිකයන්ගේ උද්ඝෝෂණ ගෙනයාමට 1865 දී පිහිටු වූ සංවිධානය කුමක්ද?
7. එම උද්ඝෝෂණවලට නායකත්වය දුන් පුද්ගලයන් තිදෙනෙක් හා උද්ඝෝෂණ මෙහෙයවීමට මුල්වූ සංවිධාන නම් කරන්න.
8. මුල්වරට යටත් විජිතභාර ලේකම්වරයාට විධිමත් සන්දේශයක් ඉදිරිපත් කළේ කවුද?
9. එම ප්‍රතිසංස්කරණ මගින් ලාංකිකයන් ඉදිරිපත් කළ ප්‍රතිසංස්කරණ යෝජනා මොනවාද?
10. කෲව් මැකලම් ප්‍රතිසංස්කරණයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය කුමක්ද?
11. ලංකා ජාතික සංගමය සම්බන්ධයෙන් පහත කරුණු සම්පූර්ණ කරන්න.

    * පිහිටු වූ වර්ෂය

    * ප්‍රථම සභාපති

    * ප්‍රධාන අරමුණ

12. ලංකා ජාතික සංවිධානයට එක්වූ කුඩා සංවිධාන මොනවාද?
13. මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ව්‍යවස්ථාදායක සභාවට තේරී පත්වූ සාමාජිකයන් ගණන කොපමණද?

14. මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රමයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය කුමක්ද?

15. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

16. එම ආණ්ඩු ක්‍රමය යටතේ ව්‍යවස්ථාදායක සභාව හැඳින්වූයේ කුමන නමකින්ද?

17. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ පිහිටු වූ විධායක කාරක සභා හත නම් කරන්න.

18. සෝල්බරි ආණ්ඩුක්‍රමයේ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

19. මෙම ආණ්ඩුක්‍රමය යටතේ ව්‍යවස්ථාදායක සභාව හැඳින්වූයේ කුමන නමකින්ද?

20. මෙරට ප්‍රථම අග්‍රාණ්ඩුකාරවරයා නම් කරන්න.

21. ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව යනු කුමක්ද?

22. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ විධායක බලය හිමිවූයේ කාටද?

23. සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ පිහිටු වූ කොමිසම් දෙක මොනවාද?

සවියෙන් පෙරට - අපි එකට

ඉ - ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | ඉතිහාසය | 3 | 05. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික නිදහස් ව්‍යාපාරය - පිළිතුරු |

**සැකසුම: දිනූෂා සමරවීර**

**බප /හො/පලන්නොරුව ම. ම. වි.**

1. රජයේ ආදායමට වඩා වියදම වැඩිවීම
2. i) රජයේ ආදායම් මාර්ග හා වියදම් කටයුතු

   ii) අධිකරණ ක්ෂේත්‍රය
3. i) ව්‍යවස්ථාදායක සභා හා විධායක සභා පිහිටුවීම

   ii) උඩරට හා පහතරට ප්‍රදේශ ඒකාබද්ධ වූ පාලන ක්‍රමයක් හඳුන්වාදීම

   iii) පරිපාලන කටයුතු සඳහා මුළු රට පළාත් පහකට බෙදීම

   iv) අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම

   v) ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් කිරීම
4. ආණ්ඩුකාරවරයාගේ බලතල අඩුකිරීම
5. i) උඩරට හා පහතරට ඒකාබද්ධ වූ පාලන ක්‍රමයක් හඳුන්වාදීම

   ii) පරිපාලන කටයුතු සඳහා රට පළාත් පහකට බෙදීම
6. ලංකා සංගමය
7. **<u>නායකත්වය දුන් පුද්ගලයන්</u>**

   i) පොන්නම්බලම් රාමනාදන්

   ii) සර් ජේම්ස් පීරිස්

   **<u>උද්ඝෝෂණ මෙහෙයවීමට මුල්වූ සංවිධාන</u>**

   i) හලාවත සංගමය

   ii) යාපනය සංගමය

8. සර් ජේම්ස් පීරිස්

9. i) ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජිකයන් වැඩි කිරීම

ii) ව්‍යවස්ථාදායක සභාවට ඡන්ද බලයෙන් නියෝජිතයන් පත් කිරීම

iii) වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම

10. ඡන්ද බලයෙන් නියෝජිතයන් තෝරා පත්කරගැනීම

11. i) පිහිටු වූ වර්ෂය - 1919

ii) ප්‍රථම සභාපති - පොන්නම්බලම් අරුනාචලම් මහතා

iii) ප්‍රධාන අරමුණ - ලාංකිකයන් අතට දේශපාලන බලතල ලබාගැනීම සඳහා ශක්තිමත් උද්ඝෝෂණ ව්‍යාපාරයක් දියත් කිරීම

12. i) හලාවත සංගමය

ii) යාපනය සංගමය

iii) ලංකා ජාතික සංවිධානය

iv) ලංකා ප්‍රතිසංස්කරණ සංගමය

13. 37

14. ව්‍යවස්ථාදායක සභාව තුළ නිල නොලත් පිරිස සැබෑ ලෙසම බහුතරයක් වීම

15. i) රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම

ii) සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම

iii) විධායක කාරක සභා පිහිටුවීම

16. රාජ්‍ය මන්ත්‍රණ සභාව

17. i) ස්වදේශ කටයුතු පිළිබඳ කාරක සභාව

ii) කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ කාරක සභාව

iii) පළාත් පාලනය පිළිබඳ කාරක සභාව

iv) සෞඛ්‍ය පිළිබඳ කාරක සභාව

v) අධ්‍යාපනය පිළිබඳ කාරක සභාව

vi) කම්කරු කර්මාන්තය හා වෙළෙඳාම පිළිබඳ කාරක සභාව

vii) ගමනාගමනය හා පොදු වැඩ කටයුතු පිළිබඳ කාරක සභාව

18. i) අග්‍රාණ්ඩුකාර ධූරයක් ස්ථාපිත කිරීම

ii) ද්වීමණ්ඩල පාර්ලිමේන්තුවක් පිහිටුවීම

iii) අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයක් ඇති කිරීම

iv) රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම පිහිටුවීම

19. පාර්ලිමේන්තුව

20. සර් හෙන්රි මන්ක් මේසන් මුවර්

21. මහජන මන්ත්‍රී මණ්ඩලය හා සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය ලෙස මණ්ඩල දෙකකින් සමන්විත වූ පාර්ලිමේන්තුව

22. අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය

23. රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම